# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2014
## Primary Piriven Mid Year Term Test - 2014
1 වසර / Grade 1

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**සිංහල**
**Sinhala**

කාලය : පැය දෙකයි
Time : Two hours

❖ **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 06 කට පිළිතුරු ලියන්න.**

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 100 කට නොඅඩු වාක්‍ය රචනයක් ලියන්න.
   i. සුන්දර ශ්‍රී ලංකා
   ii. සිංහල අලුත් අවුරුද්ද
   iii. උත්සාහයෙන් ජයගනිමු
   iv. අපේ දෙමව්පියෝ
   v. මා කැමති ජාතික වීරයා

(ලකුණු 25)

02. (අ) පහත සඳහන් පදවල ස්ත්‍රී ලිංග පද ලියන්න.
   i. ගිරවා   ii. බමුණා   iii. මාමා   iv. කොල්ලා   v. අලියා
(ලකුණු 05)

(ආ) පහත සඳහන් පදවලට සමානාර්ථ පදය බැගින් ලියන්න.
   i. තරුව   ii. ජලය   iii. අහස   iv. නිවස   iv. එළිය
(ලකුණු 05)

(ඇ) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.
   i. ලස්සන   ii. දුප්පත්   iii. කුසල්   iv. සුදු   iv. හොඳ
(ලකුණු 05)

03. (අ) ''ක'' වර්ගයට අයත් සියලු අකුරු ලියා දක්වන්න. (ලකුණු 05)

(ආ) ස්වර අකුරු සියල්ල ලියා දක්වන්න. (ලකුණු 05)

(ඇ) පහත සඳහන් පිලි ලියා දක්වන්න.
ඇදපිල්ල / ඇදය , පාපිල්ල , ගැටය සහිත ඇලපිල්ල , ගයනුකිත්ත , කොම්බුව
(ලකුණු 05)

04. (අ) හිස්තැන් පුරවා පහත සඳහන් වචන සම්පූර්ණ කරන්න.
   i. නි.......මග.......පා.......ස්ථා....... .......
   ii. .......ඩගෙ ....... .......
   iii. පො.......ප....... .......පුව
   iv. ම.......ලා.......ම
   v. ග ....... .......දෙණි.......
(ලකුණු 05)

(ආ) ප්‍රාණවාචී නාම පද 05 ක් සහ අප්‍රාණවාචී නාම පද 05 ක් ලියන්න.
(ලකුණු 10)

05. (අ) වරහන් තුළ ඇති වචන අතරින් සුදුසු වචනය තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. ............................................. වන්දනා ගමනක් ගියෙමු. ( අපි / මම )
ii. ............................................. පෙරහැර බැලීමට ගියහ. ( ඔව්හු / ඔවුන් )
iii. ............................................. කුමක් කළෙහි. ( තෝ / තෙපි )
iv. ............................................. කුඹුරු කොටති. ( ගොවියා / ගොවියෝ )
v. ............................................. නගරයට ගියා ය. ( අම්මා / ළමයා )

(ලකුණු 10)

(ආ) මෙම අකුරු හඳුන්වන නම් ලියන්න.

ඕ = ...............  ළ = ...............
ශ = ...............  ඛ = ...............
ණ = ...............

(ලකුණු 05)

06. (අ) පහත සඳහන් කවි සම්පූර්ණ කරන්න.

i. මස් ලේ නැති ඇට බලු ලෙවකන්නේ
ii. ලිප ගිනි මොලවන තෙක් දිය සැළියේ

(ලකුණු 10)

(ආ) පහත සඳහන් කවියේ තේරුම ලියන්න.

*
අදමින් ජීවත් වෙනවා විතරට
දැහැමින් මිය යනු සොඳ මැයි දන හට
මෙලෙසින් වදහළ මුනි බණ සිහි කොට
සැබැවින් පින් කොට පැමිණෙව් නිවනට

(ලකුණු 05)

07. (අ) ච , ඡ , ජ , ඦ යන අකුරු යෙදෙන වචන දෙක බැගින් ලියන්න.

(ලකුණු 04)

(ආ) පහත සඳහන් වචන අකාරාදී පිළිවෙළට ලියන්න.

**කටුගස්තොට , අම්පාර , මැදවච්චිය , යාපනය , වත්තේගම , ගම්පහ , දෙණියාය , පුත්තලම , පොළොන්නරුව , ත්‍රිකුණාමලය**

(ලකුණු 06)

(ඇ) බින්දුවකින් පටන් ගන්නා අකුරු දෙකක් සහ බඳ යටින් බෙදුණු අකුරු තුනක් ලියන්න.

(ලකුණු 05)

08. මඩොල්දූව නවකථාවේ ඔබ සිත් ගත් චරිතයක් නම් කර, එසේ සිත් ගැනීමට බලපෑ හේතු කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 15)

| | |
|---|---|
| | **මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2014** |
| | **Primary Piriven Year End Term Test - 2014** |
| | 1 වසර / Grade 1 |
| **සිංහල**<br>**Sinhala** | කාලය : පැය දෙකයි<br>Time : Two hours |

❖ **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 06 කට පිළිතුරු ලියන්න.**

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 100 කට නොඅඩු වාක්‍ය රචනයක් ලියන්න.

i. ආනන්ද හාමුදුරුවෝ
ii. ශ්‍රී මහා බෝධිය
iii. දළදා පෙරහැර
iv. මා ගිය විනෝද ගමනක්
v. ඉගෙනීමේ අගය වටහා ගනිමු.

(ලකුණු 25)

02. (අ) "ච" වර්ගයට අයත් සියලු අකුරු ලියා දක්වන්න.

(ලකුණු 05)

(ආ) පහත සඳහන් පිල්ලම් නම් කරන්න.

i. ා    ii. ෟ    iii. ෙ    iv. ැ    v. ු

(ලකුණු 05)

(ඇ) පහත සඳහන් නම් අකාරාදී පිළිවෙළට ලියන්න.

i. සීයා   ii. අම්මා   iii. අක්කා   iv. තාත්තා   v. අයියා
vi. ආච්චි   vii. නංගී   viii. මල්ලී   ix. මාමා   x. බාප්පා

(ලකුණු 05)

03. (අ) සචේතනික නාම පද 05 ක් සහ අචේතනික නාම පද 05 ක් ලියන්න.

(ලකුණු 05)

(ආ) වාක්‍යයට ගැළපෙන සර්වනාම පදය වරහන් තුළින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

**( ඇය , නුඹ , ඒවා , එය , ඌ , මම , ඔහු , අපි )**

1. නයනා බුද්ධිමත් දැරියකි. .......................... නිතර පොත්පත් කියවයි.
2. ගවයා සිව්පාවෙකි. ................. මිනිසාට විවිධාකාරයෙන් උපකාර වෙයි.
3. අපි පැළ සිටවමු. .......................... වැඩුණු පසු මිනිසා ඇතුළු සතුන්ට බොහෝ ප්‍රයෝජන ලැබේ.
4. තුත්තිරි ගස ද ගසකි. .......................... බෙහෙතට ගැනේ.
5. නිමල් සෙල්ලම් කරයි. .......................... ඉගෙන ගැනීමට ද දක්ෂයි.

(ලකුණු 10)

04. (අ) පහත සඳහන් පදවලට සමානාර්ථ පද එක බැගින් ලියන්න.

i. මියගියා    ii. ඉර    iii. මව    iv. ලංකාව    v. අලංකාර

(ලකුණු 05)

(ආ) පහත සඳහන් පද වලට විරුද්ධාර්ථ පද ලියන්න.

i. දුප්පත්    ii. බාල    iii. උගත්    iv. මිහිරි    v. කරදිය

(ලකුණු 05)

(ඇ) පහත සඳහන් පදවල පුරුෂලිංග පද ලියන්න.

i. වැඳිරී    ii. වෙළඹ    iii. නැන්දා    iv. කිකිළි    v. කුමරිය

(ලකුණු 05)

05. (අ) පහත සඳහන් අර්ථය අපැහැදිලි වාක්‍ය වල පද මාරු කර අර්ථවත් වාක්‍ය තනන්න.

i. ද කරමු අපි කුමක්?

ii. පුදමි නෙළුම් මල් මම

iii. භූමියකි අභය පන්සල

iv. දෙසත් නාහිමියෝ දම්

v. පැන යති පැන හාවෝ

(ලකුණු 05)

(ආ) සුදුසු විරාම ලක්ෂණ යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. මම නිදුක් වෙම්වා

ii. සතියකට දින කීයක් තිබේද

iii. සුබ නව වසරක් වේවා

iv. අහෝ   සිදුවූ විපතක මහත

v. ශ්‍රී ලංකාවේ අගනුවර කුමක්ද

(ලකුණු 05)

(ඇ) සුදුසු පද වරහන් තුළින් තෝරා ගෙන පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. ......................... දශක තුනකට පසු නාගදීපය වැඳීමට ගියහ. ( ඔවුහු , ඔවුන් )

ii. ......................... ගීතයට සවන් දෙමු. ( අපි , මම )

iii. ......................... මුහුදට ගලා බසී. ( ගංගා , ගංගාවෝ )

iv. නුඹලා පාසල් ......................... ( ගියෙහි , ගියෙහු )

v. වෛද්‍යවරු රෝගීන් සුවපත් ......................... ( කරයි , කරති )

(ලකුණු 05)

06. (අ) හිස්තැන් පුරවන්න.

i. අ.......ණු.......ම
ii. සිරි....... .......ව.......ත
iii. .......ත්.......ර.......ම
iv. ව.......ගම්.......ය
v. බෙ....... .......න්.......ල
vi. .......ල්.......මුව
vii. උත්.......රා.......ම.......
viii. මිහි.......ත .......ය
ix. ස.......ග ....... .......හාර.......
x. ක.......පාගො.......

(ලකුණු 10)

(ආ) පහත සඳහන් පද යොදා අදහස පැහැදිලි වන සේ වාක්‍ය බැගින් ලියන්න.

උපකාරය , කම්මැලි , පිරිසිදු , ගංගාව , කඩිසර

(ලකුණු 05)

07. පහත සඳහන් කවි සම්පූර්ණ කර නැවත ලියන්න.

i. ලිප ගිනි මොලවන තෙක් දිය සැළියේ
ii. කරන කලට පව් මිහිරිය මීසේ
iii. වැනුවා නම් බුදු ගුණ වැනුවාමය

(ලකුණු 15)

08. i. මඩොල්දූව පිහිටා ඇති දිස්ත්‍රික්කය නම් කරන්න.
ii. මඩොල්දූව නවකථාවේ කථා පුවත් 03 ක් නම් කරන්න.
iii. මඩොල්දූව රචනා කළ කතුවරයාගේ තවත් ග්‍රන්ථ 02 ක් නම් කරන්න.
iv. ''මග්ගොනට යවනවා'' යන්නෙහි තේරුම කුමක්ද?
v. ගෙවල් බිඳීමෙන් පසු ජින්නා ගැන සොයන්නට වූයේ කවුද?

(ලකුණු 15)